[සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා [illegible] I [illegible] 2004

විශ්ලේෂණාත්මක රචනය

(පැය දෙකයි)

ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

1. පහත දක්වෙන මාතෘකා අතුරෙන් එකක් තෝරා ගෙන විශ්ලේෂණාත්මක හා විවේචනාත්මක ලෙස ඔබේ අදහස් ඉදිරිපත් කරමින් වචන 200 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.

   (අ) ශ්‍රී ලංකාවේ දේශපාලනයේ ප්‍රමුඛතා ලෙස වී ඇත්තේ ජාතික සමගිය හා රටේ සංවර්ධනය උදෙසා ද?
   (ආ) වර්තමාන ශ්‍රී ලංකාවේ සදාචාරාත්මක ලක්ෂණ හා ගුණාංගයන්හි පරිහානිය පළවාහැරීම සඳහා පිළියම් වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග
   (ඇ) ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යවස්ථාදායක රාමුව තුළ රැඳී සිටිමින් බලය විමධ්‍යගත කිරීමේ කාර්යය සිදු කළ හැකි ද?
   (ඈ) ඉරාක යුද්ධය හා එමගින් ලෝකයේ මිත්‍ර රටවල් අතර දේශපාලනික හා ආර්ථික සංවර්ධන කටයුතු කෙරෙහි ඇති වූ බලපෑම
   (ඉ) ක්‍රීඩාවල යෙදිය යුත්තේ ශරීරය, තරඟකාරීත්වය හෝ මුදල් ප්‍රතිලාභ උදෙසා නොවේ. පුද්ගල දියුණුව හා විනෝදය ළඟා කර ගැනීම උදෙසාය
   (ඊ) ලෝක බැංකුව හා එමගින් තුන්වන ලෝකයේ රටවල සැලසුම් හා සංවර්ධනය කෙරෙහි ඇති වන බලපෑම
   (උ) ස්ත්‍රීවාදය ස්ත්‍රී - පුරුෂ දෙපක්ෂයේ සමගිය හා [illegible] කෙරෙහි මෙය තර්ජනයක් විය හැකි ද?

2. පහත දක්වෙන ඡේදය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ** වන සේ සාරාංශ කොට ලියා ඊට සුදුසු මාතෘකාවක් ද යොදන්න. සාරාංශයේ අග ඔබ යොදූ වචන සංඛ්‍යාව සඳහන් කරන්න.

   ශ්‍රී ලංකාව මෙන් ම ලෝකයේ වෙනත් රටවල අත්දැකීම්වලින් පෙනී යන්නේ තිරසාර සහ ගුණාත්මක වශයෙන් ඉහළ ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා සුදුසු ආර්ථික ප්‍රතිපත්ති රාමුව කුමක් ද යන්න තීරණය කිරීම ඉතා වැදගත් ආර්ථික තීරණය වන බවයි. මේ සම්බන්ධයෙන් වෙළෙඳපොළාභිමුඛ ප්‍රතිපත්ති රාමුව හොඳම විකල්පය බවට පැහැදිලිව ම පිළිගෙන ඇත. වෙනත් විකල්ප ප්‍රතිපත්ති ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ වෙනත් රටවල අසාර්ථක වී ඇති බැවිනි. ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමේ ශක්තිමත් ජනතා සහයෝගයක් ලබා ගැනීම සඳහා සහ ආර්ථික නොවන අරමුණු සමඟ ඇති විය හැකි ගැටුම් අවම කිරීම සඳහා රටේ ආවේණික සුවිශේෂී තත්ත්වයන් ද සැලකිල්ලට ගත යුතු බව පිළිගෙන ඇත. කෙසේ වෙතත්, රටේ ආවේණික සුවිශේෂ ලක්ෂණයන් ද වෙළෙඳපොළාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති රාමුව සමඟ එහි මූලික න්‍යායයන්ට හානියක් නොවන පරිදි ඒකාබද්ධ කළ යුතුය. ප්‍රධාන ආර්ථික තීරණ තුන වන කුමක් නිෂ්පාදනය කරන්නේ ද කෙසේ නිෂ්පාදනය කරන්නේ ද සහ කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේ ද යන තීරණ ගැනීමේ දී මූලික වශයෙන් මිල සංඥා ඇතුළු වෙළෙඳපොළ බලවේගයන්ට ඉඩකඩ සැලසීම සහ මූලික ආර්ථික සිද්ධාන්තවලට හානියක් නොවිය යුතුය. ඕනෑම රජයේ මැදිහත් වීමක් වෙළෙඳපොළ නොවන ප්‍රතිපත්තිවලට වඩා හැකිතාක් ම වෙළෙඳපොළ දිරිගන්වන නිසි යාන්ත්‍රණයක් තුළින් සිදු විය යුතුය. ප්‍රධාන වශයෙන් තරඟකාරී නොවන ආර්ථික කටයුතු පැවතීම හේතුවෙන් වෙළෙඳපොළ ක්‍රමයක් තුළ ඇතිවිය හැකි අඩුපාඩු වළකා ගැනීම සඳහා ඵලදායී සහ කාර්යක්ෂම නියාමන ක්‍රම ඒ සමඟම ඇති කිරීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාව 1977 දී වෙළෙඳපොළාභිමුඛ ආර්ථික ප්‍රතිපත්ති රාමුවක් පිළිගැනීමට නිවැරදි තීරණයක් ගනු ලැබූ අතර, මුලින්ම එවැනි තීරණයක් ගනු ලැබූ දකුණු ආසියානු රට ද විය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිපත්ති හඳුන්වා දී වර්ෂ 25 ක් ඉක්ම ගොස් පැවතිය ද, වෙළෙඳපොළාභිමුඛ ප්‍රතිපත්ති රාමුවක ඇති මූලික සිද්ධාන්තවලට සැපයෙන පරිදි එවැනි ක්‍රමයක තිබිය යුතු සමහර අත්‍යවශ්‍ය අංග නිසි පරිදි සම්පූර්ණ ප්‍රතිසංස්කරණයට ලක් වී නොමැත. මේ නිසා රටට ලැබිය යුතු උපරිම ප්‍රතිලාභ සීමා වී ඇත. මේ අතර වෙළෙඳපොළාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තියක මූලිකාංග පසුකාලීනව ක්‍රියාත්මක කළ දකුණු ආසියානු කලාපයේ සමහර රටවල් ශ්‍රී ලංකාව ද අභිබවා යමින් ඉහළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමටත්, ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමටත් සමත් වී ඇත.

3. පහත දක්වෙන ප්‍රශ්න අතුරෙන් එකකට පිළිතුරු සපයන්න.

   (i) ශ්‍රී ලංකාවේ බැංකු ක්‍රම පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විදේශීය බැංකුවකට අවශ්‍ය වේ. තුන් වන ලෝකයේ බැංකු ක්‍රම පිළිබඳ ව යෝජිත බැංකුව මගින් පාර්ශිකව පළ කෙරෙන වාර්තාවේ ඇතුළත් කිරීම සඳහා මේ තොරතුරු අවශ්‍ය වී ඇත. මේ ඉල්ලීමට පිළිතුරක් වශයෙන් වචන 150 ක් පමණ වන පරිදි විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

   (ii) විදේශීය විශ්වවිද්‍යාලයක පර්යේෂණ කටයුතුවල නියැලීම සඳහා ඔබට ශිෂ්‍යත්වයක් ප්‍රදානය කර ඇත. මේ සඳහා අභිමත විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ ව පිළියෙල කළ පර්යේෂණ සැලැස්මක් ඉදිරිපත් කිරීමට ඔබට සිදු වේ. ඔබේ පර්යේෂණ විෂය ක්ෂේත්‍රය, එහි වැදගත්කම, ක්‍රම විද්‍යාව හා ප්‍රයෝජන පිළිබඳ තොරතුරු ඇතුළත් කොට වචන 150ක් පමණ වන පරිදි විශ්ලේෂණාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

* * *